උ.ප.රා.සේ.කො.ස ච.ලේ.අංක : **22 / 2018**

මගේ අංකය : **NP/07/10/01/111**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය,
23.08.2018.

ලේකම්, ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
පළාත් ඉඩම් කොමසාරිස්,
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

## උතුරු පළාත් රාජ්‍ය සේවයට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III වන ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ජනපද නිලධාරි තනතුර සඳහා පුරප්පාඩු වී ඇති තනතුරු දහය (10) සඳහා සීමිත පදනම මත බඳවා ගැනීමට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා විසින් 2018 **ඔක්තෝබර් මාසය** වන විට පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වනුයේ **25.09.2018** වනදාය.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **2018.08.23** වන දිනට ක්‍රියාත්මකව පවතින පරිදි ජනපද නිලධාරි තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ ව්‍යවස්ථාව තුළ නිර්දේශිත කොන්දේසීන්, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2013.07.03වැනි දිනැති අංක 1817/30 දරණ විශේෂ ගැසට් නිවේදනයේ පලකරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන ආයතන සංග්‍රහය යනාදීන්ටත් හා බඳවා ගැනීමේ කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වන යම්කිසි සංශෝධනයන්ට අනුකූලව තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් **ජනපද නිලධාරි** තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් පත්වීම සඳහා සුදුසුකම්ලත් විභාග අපේක්ෂකයන් **ජනපද නිලධාරි** තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ සැලැස්ම තුළ සඳහන් පරිදි ඉහත තනතුරේ III වන ශ්‍රේණියට පත්කරන ලද දින සිට වසර තුනක (03) කාල පරිච්ඡේදය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 මෙම සේවාවන් ස්ථාන මාරුවීමට යටත් වූ සේවාවන් වේ. එබැවින් මෙම පත්වීම ලබන අපේක්ෂකයන් උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නන්, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතු බව අනිවාර්ය කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා මේ සම්බන්ධයෙනුත් පසුව නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුකූලව ද පත්වීම් දින සිට අවුරුදු පහක් (05) අවසන්වීමට ප්‍රථම නියම කරන ලද දෙවන භාෂාව වන රාජ්‍ය භාෂාව සමත් විය යුතුයි.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත් කිරීමට නියමිත වී ඇති සංඛ්‍යාව **දහයකි (10)**. කෙසේ වුවද දැනුම් දෙන ලද පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MN 3 - 2016** ට අනුව ජනපද නිලධාරි සේවයේ III – වන ශ්‍රේණියට ඒකාබද්ධ වැටුප් අනුපාතය රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/-** ක් වේ. (රුපියල් 31,930 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛයේ II – වන වගුවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලවන පරිදි වැටුප් ගෙවිය යුතුයි.

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරිකව නිරෝගීමත්ව සිටිය යුතුයි එමෙන්ම මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි.

04.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවා ඇති **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා අනෙක් සුදුසුකම් :-

### අ) අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය / අංක ගණිතය හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් ඇතුළු විෂයයන් හයක් (06) සමත් වී සිටිය යුතුයි.

**හා**

### ආ) වෘත්තීය සුදුසුකම් :-

සුදුසුකම් වශයෙන් අම්පාර හාර්ඩි උසස් තාක්ෂණික ආයතනයේ, වවුනියාව හෝ කුණ්ඩාලේ කෘෂිකර්ම විද්‍යාලයේ අවම වශයෙන් වසර දෙකකට (02) නොඅඩුව ලබාගත් කෘෂිකර්ම ඩිප්ලෝමා හිමිවී තිබිය යුතුයි.

**හෝ**

තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් කිසියම් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 06 (N.V.Q Level - 06) අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හා**

### ඉ) සේවා අත්දැකීම :-

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර උපදේශක III වන ශ්‍රේණියේ තනතුරේ වසර **(10)** ක සේවා කාලයට අදාළ අත්දැකීම් හිමි විය යුතු අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට කලින් පෙර අවම වශයෙන් වසර **පහක් (05)** අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අතරින් තෝරාගනු ලැබේ.

### ඊ) වයස් සීමාව :-

සීමිත තරඟ විභාගය මඟින් බඳවා ගැනීමට වයස් සීමාව බලපාන්නේ නැත.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ව්‍යුහගත සම්මුක පරීක්ෂණය මඟින් කුසලතා පදනම මත හා බඳවා ගන්නා අවස්ථාවේදී ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටි, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන්ට අනුකූලව ජනපද නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මඟින් ඉල්ලා ඇති සියළුම සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වන හිමිකම් අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම් හා ලියකියවිලි පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

06.2 ඉහත සඳහන් තනතුරට අයදුම්කර සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන්, දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩුවලට අනුව පත්වීම සඳහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම් කරන ක්‍රමය :-

08.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 4.8 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 4.9 සිට 7.0 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිර කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 25.09.2018 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස උඩකොටසේ **"ජනපද නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මඟින් දැන්වීමක් නිකුත කරනු ලැබේ. දැන්වීම් පළවූ පසුව කිසියම් අපේක්ෂකයකුහට අවම වශයනේ දින තුනකට (03) ප්‍රථම හෝ විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැති නම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940)

**සටහන :-**

ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. තවද අයදුම්පත් අවසාන දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම නිරීක්ෂක තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම් පත

(ii) වලංගු විදේශ ගමන්බලපත්‍රය.

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේක කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නිමයන්ට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නියමයන් උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් පනවනු ලබන දඬුවමට යටත් වීමට සිදුවේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට කුමන අවස්ථාවකදී හෝ තොරතුරු දැන ගැනීමට ලැබුණහොත්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු

විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් මිනැම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කළ හැකිය.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුයි.

## 12. විභාගය සඳහා වන සැලැස්ම :-

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පහත සඳහන් විෂයන් ඇතුළත් වන පරිදි සකස් කර ඇත.

| අංක | තෝරා ගන්නා ක්‍රමය | ලකුණු | කරුණු |
|---|---|---|---|
| 01 | සේවා අත්දැකීම හා ජ්‍යෙෂ්ඨතාවය | 90 | අඛණ්ඩ හා සතුටුදායක සේවාකාලය තුළ එක් එක් වසරක් සඳහාම ලකුණු පහ (05) බැගින් ප්‍රදානය කරනු ලැබේ. එමෙන් මෙම අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලය මාස හයකට වැඩි නමුත් අවුරුද්දකට අඩු බවක් පෙනී ගියහොත් එයට ලකුණු දෙකහමාරක් (2.5) ප්‍රදානය කරනු ලැබේ. කෙසේ වුවද මාස හයකට අඩු ඉහත සඳහන් සේවා කාලයට ලකුණු ප්‍රදානය කරන්නේ නැත. |
| 02 | සම්මුඛ පරීක්ෂණය | 10 | ආකල්පය, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා පිළිතුරු දීම. |
| | **සම්පූර්ණ** | **100** | --- |

13. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ වෙනස්කමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කළ යුතුයි.

14. මෙම දැන්වීම ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවය කරන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ක්ෂේත්‍ර උපදේශක තනතුර දරණ නිලධාරීන්ගේ අවධානයට යොමු කරනු මැනවි.

15. මෙම විභාගය හා සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් දැක බලාගත හැකිය.

**අ. සිවබාලසුන්දරන්**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
23.08.2018

**පිටපත් :-**

01. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - දැ.ගැ.ස
02. ආණ්ඩුකාරතුමාගේ ලේකම්, උතුරු පළාත. - දැ.ගැ.ස
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් – රාජ්‍ය පරිපාලන, උතුරු පළාත. - දැ.ගැ.ස
04. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, උතුරු පළාත.

- අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකර අප වෙත යොමු කිරීම සඳහා.